# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2456/54 – 2025 ඔක්තෝබර් මස 02 වැනි බ්‍රහස්පතින්දා – 2025.10.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද්දා වූ ද, 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස අතරින් මෙහි පහත විස්තර වන ඉඩම් කොටසෙහි භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාර ගෙන නැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**කේ.ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 4-3/10/2012/LRB/324 II
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේඅංකය : WGSWD&EIP/ACQ/KB/16

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 576A, තුම්බෝවිල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුම්බෝවිල (කොට්ඨාස අංක 10 - තුම්බෝවිල, කැස්බෑව නගර සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2025/4 හා 2025.01.20 දිනැති අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර B - කුරුඳුගහ කුඹුර - ප්‍රමාණය : හෙක්. 0.0235**

උතුරට**:** කැබලි අක්ෂර A, මු.පි.කො 9600 හි කැබලි අංක 12 වැනි බිම් කැබැල්ලේ කොටසක් සහ පාර; නැගෙනහිරට**:** පාර සහ මු.පි.කො 9600 හි කැබලි අංක 10; දකුණට**:** මු.පි.කො 9600හි කැබලි අංක 10 සහ 12; බටහිරට**:** මු.පි.කො 9600හි කැබලි අංක 12 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.

EOG 10-0025



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 නොවැම්බර් මස 07 දින අංක 1887/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 308 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරි මාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වැනි උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ.ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 4-3/10/2012/LRB/324
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය : WGSWD&EIP/ACQ/KB/16

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

#### 1 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැස්බෑව නගරසභා සීමාව තුළ සුළු කොට්ඨාසයේ, තුම්බෝවිල උතුර-576A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තුම්බෝවිල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො9600 හා 2016.04.01 දිනැති පිඹුරෙහි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 10 - කුරුඳුගහ කුඹුර - ප්‍රමාණය : හෙක්. 0.0177**

උතුරට**:** කැබලි අංක 11 සහ පාර; නැගෙනහිරට**:** පාර; දකුණට**:** පාර සහ කැබලි අංක 12; බටහිරට**:** කැබලි අංක 12 සහ 11.

EOG 10-0026

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද්දා වූ ද, 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස අතරින් මෙහි පහත විස්තර වන ඉඩම් කොටසෙහි භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාර ගෙන නැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1887/41 හා 2014.11.07 වැනි දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 308 හා 2014.10.31 වැනි දින දරන ආඥාවට අයත් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**කේ.ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය

මගේ අංකය : 4-3/10/2012/LRB/324 II
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය : WGSWD&EIP/ACQ/KB/16

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුම්බෝවිල ( කැස්බෑව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2012/1094 හා 2013.10.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 95 - ගල්පොත්ත ඔිවිට - ප්‍රමාණය : හෙක්. 0.1485**

උතුරට**:** මෙම පිඹුරේ කැබලි අංක 80 සහ 96; නැගෙනහිරට**:** මෙම පිඹුරේ කැබලි අංක 96, දූවවත්ත පාරේ වරිපනම් අංකය සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම සහ දූවවත්ත වරිපනම් අංක 5/12 දරණ ඉඩම; දකුණට**:** දූවවත්ත පාරේ වරිපනම් අංක 5/12 දරණ ඉඩම සහ මෙම පිඹුරේ කැබලි අංක 126; බටහිරට**:** මෙම පිඹුරේ කැබලි අංක 80.

EOG 10-0027

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.